# කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය

# ශ්‍රම වාසනා අරමුදල

## පුරප්පාඩු

ශ්‍රම වාසනා අරමුදලේ පහත දැක්වෙන පුරප්පාඩු සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති ශ්‍රී ලාංකිකයන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**01. සහකාර කළමණාකරු - තොරතුරු තාක්ෂණ (01)**

**සුදුසුකම්**

I. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් තොරතුරු තාක්ෂණය/ පරිගණක විද්‍යාව පිළිබඳ හෝ විෂය ක්ෂේත්‍රයට අදාළ වෙනත් උපාධියක් ලබා තිබීම.

හෝ

II. තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික/වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය පිළිබඳ ජාතික වෘත්තීය කුසලතා හත (NVQ 7) මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

හෝ

III. තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික/වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය පිළිබඳ ජාතික වෘත්තීය කුසලතා හය (NVQ 6) මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම සමඟ සංස්ථාවක, මණ්ඩලයක හෝ පිළිගත් ව්‍යවස්ථාපිත ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ වසර පහක (05) පශ්චාත් පළපුරුද්දක් පැවතීම.

හෝ

IV. තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික/වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය පිළිබඳ ජාතික වෘත්තීය කුසලතා පහ (NVQ 5) මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම සමඟ සංස්ථාවක, මණ්ඩලයක හෝ පිළිගත් ව්‍යවස්ථාපිත ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ වසර පහක (10) පශ්චාත් පළපුරුද්දක් පැවතීම.

**වෙනත් සුදුසුකම්**

- වීඩියෝ/ රූප සංස්කරණය හා චිත්‍රක නිර්මාණය සම්බන්ධව දැනුම හා පළපුරුද්ද
- Mobile App නිර්මාණය සම්බන්ධ දැනුම හා පළපුරුද්ද

**තනතුරු සංඛ්‍යාව -** 01

**වැටුප් පරිමාව -** JM 1-1 - 2016 - (Rs. 42,600 - 10 x 755 - 18 x 1,135 - 70,580)

**වයස -** අවුරුදු 22ට නොඅඩු හා 45ට නොවැඩි විය යුතු ය.

**02. කළමණාකරණ සහකාර - තාක්ෂණික නොවන (01)**

**සුදුසුකම් -** අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී

I. ගණිතය
II. සිංහල/දෙමළ
III. ඉංග්‍රීසි භාෂාව

යන විෂයන් ඇතුළත්ව විෂයන් 04කට සම්මාන සාමාර්ථයන් සහිතව විෂයන් 06කින් එකවර සමත්වීම හා අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී විෂයන් තුනක් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත් වී තිබීම සහ මාස 06 කට නොඅඩු පරිගණක පාඨමාලාවක් හදාරා තිබීම.

**වෙනත් සුදුසුකම්**

- මාධ්‍ය භාෂාවට අමතරව සිංහල හෝ දෙමළ භාෂාව සඳහා දක්වන කුසලතාවය
- පොදු කාර්යයන් වලදී කණ්ඩායම් වශයෙන් හා නායකත්වයගෙන කටයුතු කර තිබීම

**තනතුරු සංඛ්‍යාව -** 01

**වැටුප් පරිමාව -** MA -1-1-2016 (Rs. 27,910 - 10 x 300 - 7 x 350 – 4 x 495- 20 x 660 -48,540)

**වයස -** අවුරුදු 18ට නොඅඩු හා 45ට නොවැඩි විය යුතු ය.

**ප්‍රතිලාභ-**

1. සේවක අර්ථසාධක අරමුදල
2. සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදල
3. රජයේ අනුමත දීමනා
4. රජයේ අනුමත ප්‍රසාද දීමනා
5. අග්‍රහාර වෛද්‍ය රක්ෂණය

අයදුම්පත් යොමු කිරීම **- 2024.04.18** දිනට හෝ ඊට ප්‍රථම ඥාතීන් නොවන දෙදෙනෙකුගේ නම හා ලිපිනය ඇතුළත් නිර්දේශයන් සහිත අයදුම් පත්‍රයක් **පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් යොමු කළ යුතු අතර** දැනටමත් රාජ්‍ය අංශයේ හෝ අර්ධ රාජ්‍ය අංශයේ සේවය කරන අයදුම්කරුවන් තම අයදුම්පත ආයතන ප්‍රධානියාගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. තවද අයදුම්පත බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම් කරන තනතුර සඳහන් විය යුතුය. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් සහ අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**සාමාන්‍යාධිකාරී, ශ්‍රම වාසනා අරමුදල, අංක 97, ජාවත්ත පාර, කොළඹ 05,** වැඩිදුර තොරතුරු සඳහා අපගේ වෙබ් අඩවිය වන **www.svf.gov.lk** වෙත පිවිසෙන්න.

**සාමාන්‍යාධිකාරී,**
**ශ්‍රම වාසනා අරමුදල,**
**අංක 97, ජාවත්ත පාර, කොළඹ 05.**